මෝටර් රථවල ළමුන් සමග ගමන් කිරීම

ඔස්ට්‍රේලියානු නීතියට අනුව වයස අවුරුදු 7ට අඩු සියලු ළමුන් මෝටර් රථයක ගමන් කිරීමේදී ළමා ආසනයක් භාවිත කිරීම අවශ්‍යය. මෙසේ කිරීම අවශ්‍ය වන්නේ හදිසි අනතුරක් සිදු වුවහොත් ඉන් වන හානියෙන් ළමයාව ආරක්ෂා කිරීමටය.

අවශ්‍ය ළමා ආසනය තීරණය වන්නේ දරුවාගේ වයස අනුවය. ළමා ආසනය දරුවාගේ ප්‍රමාණයට සරිලන එකක් විය යුතුය; එය මනාව සකසා සහ ආසන පටිවලින් තද කොට තිබිය යුතුය; එසේම රථය තුළ මනා සේ සවි කොට තිබිය යුතුය.

Sinhalese

EARLY LEARNING ASSOCIATION AUSTRALIA

0-6 දක්වා වයස් කාණ්ඩයේ ළමුන්

පසුපසට මුහුණ ලා සවිකළ ළමා ආසනයක තැබිය යුතුය. ළමා ආසනය රථයේ ඉදිරි අසුනේ නොව - පසුපස අසුනේ තිබිය යුතුය.

මාස 6 සිට අවුරුදු 4 දක්වා වයස් කාණ්ඩයේ ළමුන්

- ළමයාගේ වයස අනුව පසුපසට මුහුණ ලා සවිකළ ළමා ආසනයක හෝ ආසන පටි සහිත ඉදිරියට මුහුණ ලා ඇති මෝටර් රථ ආසනයක ගමන් කළ හැකිය. දරුවා රථයේ ඉදිරි අසුනේ නොව - පසුපස අසුනේ සවිකළ ළමා ආසනයක පමණක් ගමන් කළ යුතුය.
- වයස අවුරුදු 8 දක්වා ළමුන් සඳහා වූ සන්නාහ සහිත ළමා ආසන දැන් වෙළඳපොළේ ඇත.

අවුරුදු 4 සිට අඩුම තරමින් වයස අවුරුදු 7 දක්වා වයස් කාණ්ඩයේ ළමුන්



- ළමයාගේ වයස අනුව ඉදිරියට මුහුණ ලා ඇති මෝටර් රථ ආසනයක හෝ හුවනයක් (එසවුමක්) සහිත ආසනයක ගමන් කළ හැකිය. හුවනයක් සහිත මෝටර් රථ ආසන ළමයා නියමිත මට්ටමට ඔසවා තබන හෙයින් ඔවුන්ට ආසන පටිය යෝග්ය වේ.
- අවුරුදු 4 - 7 වයස් කාණ්ඩයේ ළමුන්ට (හුවනයක් සහිතව) මෝටර් රථයේ ඉදිරි අසුනේ ගමන් කළ හැක්කේ පසුපස ආසන සියල්ල වයස 7ට වඩා අඩු ළමුන් විසින් භාවිත කරන්නේ නම් පමණි.
- පසුපස සහ මුදුන් පටි සහිත හුවන ආසන අනෙකුත් හුවන ආසනවලට වඩා ආරක්ෂා සහිතය.
- සෙන්ටි මීටර් 145ක් දක්වා උස වන තුරු ළමුන් හුවන ආසනයක ගමන් කළ යුතුය. ඔවුන් නිසි වයසට පෙර වැඩිහිටියන්ගේ ආසනයකට මාරු වුවහොත්, රිය අනතුරකදී ඔවුන්ට හානි සිදු වීමට ඇති ඉඩකඩ අධිකය.

ළමා ආසනය සවි කිරීම

ඔබේ වාහනයට ළමා ආසනය හෝ හුවන ආසනය සවි කිරීමේදී හැම විටම නිෂ්පාදකයාගේ උපදෙස් අනුගමනය කරන්න.

වයස අවුරුදු 4ට අඩු ළමුන් සඳහා ළමා අසනය සවි කිරීම යනු:

- සලකුණු කර ඇති සිදුරු තුළින් ආසන පටිය යවා එය තද කිරීමෙන් ළමා ආසනය මෝටර් රථයට සවි කිරීම සිදු වේ.



- මුදුන් දිගු පටිය මෝටර් රථයට අමුණනු ලැබේ.

- දරුවා ළමා ආසනයේ රැඳවීම සඳහා පටිවලින් තද කරනු ලැබේ.



වයස අවුරුදු 4ට වැඩි ළමුන් සඳහා, හුවන ආසනයක ගමන් කිරීම:

- මුදුන් දිගු පටියක් තිබේ නම් එය මෝටර් රථයට අමුණන්න.
- ආසන පටිය ළමයා වටා තදකොට තිබිය යුතුය.



ළමා ආසනයක් තෝරා ගැනීම

ඔබට භාවිත කළ හැකි වන්නේ ඕස්ට්රේලියානු ආරක්ෂක ප්රමිතීන්ට (AS/NZS 1754) අනුකූල ළමා ආසන හෝ හුවන ආසන පමණි. මෙයින් අදහස් වන්නේ වෙනත් රටවලින් ගෙන එනු ලබන මෝටර් රථ ආසන වළංගු නොවන බවයි.

හානි වීම හේතුවෙන් ආරක්ෂා සහිත නොවිය හැකි බැවින් පාවිච්චි කරන ලද ළමා ආසන හෝ හුවන ආසන භාවිත නොකිරීමට උත්සාහ කරන්න.

ළමා ආසන භාවිත නොකිරීම සඳහා විශාල දඩවලට යටත් වීමට මෙන්ම රියදුරු බලපත්ර යෝග්යතා ලකුණු අඩුවීම ද හේතු වේ. මෙම දඩ මෝටර් රථය තුළ මනා ලෙස අසුන් ගන්වා නැති සියලු පුද්ගලයන්ට අදාළ වේ.